# යටත්විජිතවාදය, ජාතික ප්‍රබෝධය සහ ප්‍රභූ දේශපාලනය

**ඩී.ජේ.කේ. ඉහළගෙදර**
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.
ihalagedara@yahoo.com

ප්‍රමුඛ පද: ප්‍රභූ පංතිය, මොරටු සංගමය, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ, බ්‍රිතාන්‍ය පාලනය

## හැඳින්වීම

1915-1931 දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකික සමාජයේ සිදු වන දේශපාලන මෙන් ම සමාජ ආර්ථික වෙනස්කම් පසු විජිත රාජ්‍යයේ ද ඓතිහාසික ගමන් මග තීරණය කිරීමට පදනම සකසා ඇත. නමුත් මේ ක්‍රියාවලිය සිදුවන්නේ යටත්විජිත දේශපාලන සමාජ ආර්ථික රාමුවක් තුළයි.

## අරමුණ

1915-1931 දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් පිළිබඳ ව අවධානය යොමු කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ව මෙ තෙක් සිදුකර ඇති පර්යේෂණ හා අධ්‍යනයන් තුළින් පුළුල් ලෙස ආවරණය නොකරන ලද ප්‍රාදේශීය නායකත්වයන් හා සංවිධාන වල ක්‍රියාකාරිත්වය පිළිබඳ ව අවධානය යොමු කරමින් පර්යේෂණය ඉදිරියට ගෙන යාම මෙහි අරමුණයි.

## පර්යේෂණක්ෂේත්‍රය

1915-1931 දක්වා කාල පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක කාල පරිච්ඡේදයකි. 1915 සිංහල මුස්ලිම් ගැටීම (1915 Riots) බ්‍රිතාන්‍ය යටත්විජිත ආණ්ඩුව විසින් මර්ධනය කිරීමෙන් මතු වූ තත්ත්වය දේශීය නායකත්වය විසින් මෙ තෙක් යටත්විජිත ක්‍රියාකාරීත්වය පිළිබඳ ව දැක් වූ අදහස්වල වෙනස් ප්‍රවණතාවක් ඉස්මතු කිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් වූයේ දේශපාලන අවශ්‍යතාවන් වෙනුවෙන් යටත්විජිත රජය සමඟ කේවල් කිරීමේ උපක්‍රම වෙනස් කිරීමයි. ඒ අනුව වඩාත් ශක්තිමත් දේශපාලන සංවිධාන තුළින් සිය ඉල්ලීම් යටත්විජිත රජය වෙත යොමුකිරීමේ අවශ්‍යතාව ඉස්මතු වී ය.

## පර්යේෂණ ගැටලුව

මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව ලෙස මූලික කරුණු දෙකක් ඉස්මතු කිරීමට උත්සහ දරා ඇත.

- දේශපාලන ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය මෙ රට ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා මත පමණක් ඉදිරියටගෙන ගිය ව්‍යාපාරයක් ද?
- මේ සඳහා දායක වූ ප්‍රාදේශීය නායකත්වයන් හා සංවිධාන කවරේ ද?

**අධ්‍යයනයේ වැදගත්කම**

යටත්විජිතවාදි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වූ අවධියක් තුළ දියත් වූ මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය පිළිබඳ ව පවතින සම්ප්‍රදායික මතය වන්නේ එය හුදෙක් දේශීය ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා මත ඔවුන් විසින් ඉදිරියට ගෙන ගිය ව්‍යාපාරයක් වූ බවයි. නමුත් මා මෙහි දී මෙම මතයෙන් ඔබ්බට ගොස් මෙ තෙක් පර්යේෂකයන්ගේ පුළුල් අවධානයකට ලක් නොවූ දේශපාලන වෙනස්වීම් හා බද්ධ වූ ප්‍රාදේශීය නායකත්වයන් හා ප්‍රාදේශීය සංවිධාන වල ක්‍රියාකාරීත්වය පිළිබඳව අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙමි. උදාහරණ ලෙස, මොරටු සංගමය, පානදුර සංගමය, දොඩන්දූවේ සංගමය, කළුතර සංගමය, කොටහේනේ සාහිත්‍ය සංගමය හා ග්‍රෑන්ඩ්පාස් සාහිත්‍ය සංගමය සලකා බැලිය හැකි වේ. මේ තුළින් ප්‍රභූ දේශපාලන ක්‍රියාකාරීත්වයට අමතර ව වෙනත් සමාජ ස්ථරවල දායකත්වය දේශපාලන වෙනස්වීම් වලට සම්බන්ධ වූ ආකාරය හඳුනා ගැනීමට උත්සාහ දරා තිබේ. ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන් මග වෙනත් දිශාවකට යොමු වි ය' 1915-1931 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය මෙම පර්යේෂණයට පාදක කොටගෙන ඇත'

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙ තෙක් සිදු කොට ඇති පර්යේෂණ මුල් කොටගත් ද්විතියික මූලාශ්‍ර හා අදාළ කාලය තුළ ප්‍රකාශයට පත් ව ඇත ප්‍රාථමික මූලාශ්‍ර සම්භාරය විමර්ශනාත්මක විග්‍රහයට ලක් කරමින් පර්යේෂණය ගොඩනැගීම පර්යේෂණ ක්‍රමවේදය ලෙස තෝරාගෙන ඇත'

**මූලාශ්‍ර පරිශීලනය**

ද්විතියික හා ප්‍රාථමික මූලාශ්‍ර පදනම් කොට ගනිමින් විශේෂයෙන්ම රාජ්‍ය ලේඛනාගාරය සතු පර්යේෂණයට අදාල "හඳුනා නොගත් මූලාශ්‍ර" " පුවත්පත් ලිපිලේඛන" ආදිය ද එ මෙන් ම අදාල කාලපරිච්ඡේදය තුළ විවිධ දේශපාන ව්‍යාපාරයන්ට සම්බන්ධ ව සිටි පුද්ගලයින් සම්මුඛ සාකච්ඡාවලට ලක් කරමින් ද රැස්කරගන්නා ලද තොරතුරු පාදක කොට ගනිමින් පර්යේෂණය ඉදිරියට ගෙනයාමට බලාපොරොත්තු වෙමි'

**නිගමනය**

1915 මතු වූ මෙම නව ප්‍රවණතාව විවිධ මුහුණුවරයන් ඔස්සේ 1931 දක්වා විහි දී යයි. මෙම අවධිය ශ්‍රී ලංකා ජාතික ව්‍යාපාරයේ වර්ධනය හා ඒ ආශ්‍රිත ව සිදු වූ ආණ්ඩුක්‍රම විකාශය සම්බන්ධයෙන් තීරණාත්මක අවධියක් ලෙස සැලකිය හැකි ය. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හා බද්ධ වී ජාතික මුහුණුවරක් ගනිමින් ක්‍රියාශීලීව ඉදිරියට පැමිණෙමින් තිබූ මෙම ව්‍යාපාරය යටත්විජිතයක් ලෙස ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදි පාලනයෙන් මිදී ස්වාධීනත්වය කරා ගමන් කළ ආකාරය පිළිබඳ හැදෑරීමට වැදගත් වේ.

1915 ඇති වූ ගැටීම (1915 Roits) සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව

විසින් අනුගමනය කරනු ලැබූ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ දේශපාලන ව්‍යාපාරය වඩාත් සංවිධානාත්මක ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමට හේතු තිබේ.ශ්‍රී ලංකාවේ 1915-1931 දක්වා සිදුවන දේශපාලන වෙනස්වීම්වල දී හුදෙක් ප්‍රභූ පැලැන්තියේ ක්‍රියාකලාපය පමණක් නොව ප්‍රාදේශීය නායකත්වයන් හා සංවිධානවල ක්‍රියාකලාපය ද වැදගත් දායකත්වයක් උසුලනබව පෙන්වා දිය හැක.

## Bibliography


Roberts, Michal,ed., *Documents of the Ceylon National Congress and Nationalist Politics in Ceylon*, Vol: I- IV, Colombo, Department of National Archives, 1977.

Bandaranayake, S.W.R.D., *Handbook of the Ceylon National Congress*, 1919-1928.

Silva, K.M.de, The Formation and Character the Ceylon National Congress 1971-1919, *Ceylon Journal of Historical and Social Studies*, Vol:x, 1973.

Silva, K.M.,ed: The Reform and Nationalist Movements in the Early Twentieth Century, *History of Ceylon*, Vol:iii, University of Ceylon, 1973

Jayawardana, Kumari, *The Rice of the Labor Movement in Ceylon*, Durham, Duke University Press,1972.

Nira, Wickramasinghe, *Ethnic Politics in Colonial Sri Lanka 1927-1947*, New Dilhi, Vikas Publishing House, 1995.

Amarasinghe Y.R. *Revolutionary Idealism and Parliamentary Politics: A Study of Trotskyism in Sri Lanka*, Colombo, Social Scientists Association, 1998.

Ariyarathna, R.A., The Beginning of Elective Representation in K.M. de Silva ed: University of Peradeniya, *1931-1981 The Sri Lanka Experience*, Colombo1981.

Fernando, Thissa, The 1915 Riots and Martial Law in Ceylon: A study of the Campaign for Justice, in a Symposium on the 1915 Communal Riots, Peradeniya, *Ceylon Studies Seminar*, pp. 97-121.1970.